# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මහජන අදහස් විමසීමේ ක්‍රියාවලියෙන් උපරිම ප්‍රයෝජන ගන්න

වැලිකන්ද - ප්‍රසාන් සමන්

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීම සඳහා ඉතිහාසයේ පළමුවරට මහජනතාවගෙන් අදහස් විමසීමේ ක්‍රියාවලියට උදාවී ඇති අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගන්නා ලෙස නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වයේ (පැෆරල් සංවිධානය) ජාතික සම්බන්ධීකාරක සුජීව ගයනාත් මහතා පවසයි.

ඔහු ඒ බව පැවසුවේ පොළොන්නරුවේ 09 වැනිදා මාධ්‍යවේදීන් පිරිසක් සමග පැවති සාකච්ඡාවකදීය.

1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැකසීමේදී මහජනතාවගේ අදහස් විමසීම හා යෝජනා ලබා නොගත් බවත් රට පාලනය කිරීමේ මූලික ලියවිල්ල සඳහා මහජන අදහස් විමසීම ප්‍රජාතන්ත්‍රවාදී රටක මූලික ලක්ෂණයක් බවත් ගයනාත් මහතා කීය. දකුණු අප්‍රිකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැකසීමේදී එම රටේ

## පැෆරල් සංවිධානය

මහජනතාවගෙන් මහජන අදහස් ලබා ගැනීම වසර 02ක් පුරා සිදුකර ඇති බවත් ශ්‍රී ලංකාවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැකසීමට මේ වසරේ මාර්තු මාසය දක්වා ඕනෑම භාෂාවකින් ලිඛිතව හෝ වාචිකව අදහස් ප්‍රකාශ කිරීමට ලබාදී ඇති කාලය ප්‍රමාණවත් නොවන බවත් ගයනාත් මහතා පෙන්වා දුන්නේය.

මෙම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවෙන් පොළොන්නරුව ජනතාවගේ අදහස් විමසීමට මේ මස 19 හා 20 යන දිනවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීම් කමිටුවේ සභාපති නීතිඥ ලාල් විජේනායක මහතා ඇතුළු 20 දෙනකුගෙන් යුත් කණ්ඩායමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැමිණීමට නියමිත බවද කීය.

එහිදී නව මැතිවරණ ක්‍රමයක් සඳහා වූ පොළොන්නරුව දිස්ත්‍රික් පුරවැසි ක්‍රියාකාරිත්වය විසින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන බවත් මෙම අවස්ථාවට ඕනෑම පුද්ගලයකුට හෝ සංවිධානයකට ඉදිරිපත් වී යෝජනා ලබාදිය හැකි බවද ගයනාත් මහතා කීවේය.



ඇමෙරිකාවේ අවුරුදු 225ක් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 27 වතාවක් සංශෝධනය වුණා. 1978 අපේ රටේ ව්‍යවස්ථාව අවුරුදු 37ක් තුළ මේ වනවිට දහනව වතාවක් සංශෝධනය වෙලා තියෙනවා. මේක රට පාලනය කරන මූලික ලියවිල්ල නිසා කෙටි කාලයක් තුළ මහජන අදහස් විමසලා හදන එක සුදුසු නැහැ.

මේකට වැඩිපුර කාලයක් යොදා ගන්න කියලා අපි පැෆරල් සංවිධානය වශයෙන් ඉල්ලීමට යෝජනා කරලා තියෙනවා. රටක් පාලනය කළ යුතු මූලික ලියවිල්ල හොඳටම කාලය අරන් කළ යුතු කාර්යක්. ඒ නිසා ඉතිහාසයේ පළමු වරට මහජනතාවගෙන් විමසීම් කරලා යෝජනා අරන් හදන මේ මූලික ලියවිල්ල වඩාත් කල් අරන් කරන එක ඉතාම වැදගත් යැයි සුජීව ගයනාත් මහතා වැඩිදුරටත් පැවැසීය.